# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රියස්ථානවල පිහිටි ස්ථාවර භෝජනාගාර බදුදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීමයි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් භෝජනාගාර වසර දෙකක කාලයකට ආහාරපාන අලෙවිකිරීමේ සේවාවන් පවත්වාගෙන යාම සඳහාපහත දක්වා ඇති සුදුසුකම් හා පලපුරුද්දක් ලත් ලංසු කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසුපත් කැඳවනු ලැබේ.

01. කැකනදුර    02. ගාල්ල වේදිකා    03. පොල්ගහවෙල උඩු මහල    04. ත්‍රිකුණාමලය    05. බදුල්ල

ඉහත සඳහන් භෝජනාගාර පිළිබඳ විස්තර ප්‍රසම්පාදන ලියවිලි යටතේ උපලේඛණ 01 හි දක්වා ඇත.

**01.සුදුසුකම්**

අදාල ක්ෂේත්‍රයට අදාලව ව්‍යාපාරයක් ලෙස වලංගු ලියාපදිංචියක් සහ වසර 01 ක පලපුරුද්දක් ලබා තිබීම හා මූල්‍යමය ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා අනුගාමී මාස 03 ක බැංකු ගණුම් ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය.

**02.ලංසු අයදුම්පත්‍ර ලබාගැනීම**

ප්‍රසම්පාදන ලියවිලි 2022 සැප්තැම්බර් මස 22 වන දින ප.ව.2.00 දක්වා දුම්රිය වෙළද හා අලෙවි කාර්යාලයෙන් හෝ භෝජනාගාරය පිහිටි දුම්රිය ස්ථානයෙන් ලබා ගත හැක.ඒ සඳහා කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන මූල්‍ය නිලධාරි වෙත හෝ අදාල භෝජනාගාරය පිහිටි දුම්රිය ස්ථානයේ දුම්රිය ස්ථානාධිපති වෙත ආපසු ගෙවනු නොලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු.1000/- ක මුදලක් ගෙවා ලබා ගන්නාලද ලදුපත දුම්රිය මූලස්ථානයේ නියෝජ්‍ය අධිකාරී (වෙළද හා අලෙවි)වෙත හෝ අදාල දුම්රිය ස්ථානයන් වෙත හෝ ඉදිරිපත් කළ යුතුය. උපලේඛණ 01 හි සඳහන් සියළු භෝජනාගාර වෙනවෙනම සළකා ලංසු ඉදිරිපත්කළ යුතු අතර, ලංසු පෝරම ගාස්තුවට අමතරව එම ලේඛණයේ දක්වා ඇති පරිදි ආපසු ගෙවනු ලබන ලංසු බැදුම්කරයක්ද ගෙවිය යුතුය.

**03. ලංසු අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම**

ඉහත 02 යටතේ සඳහන් ආකාරයට එක් එක් භෝජනාගාරය වෙනුවෙන් ලබාගන්නා ලද අයදුම්පත්‍ර මුල් පිටපත හා අනු පිටපත නිසිපරිදි සම්පූර්ණ කර කවර දෙකක බහා මුද්‍රා තැබිය යුතුය. එම කවරවල මුල් පිටපත හා අනුපිටපත ලෙස පැහැදිලිව සඳහන්කළ යුතුය. එම කවර දෙක තනිකවරයක බහා වම් පස ඉහල කෙළවරේ භෝජනාගාරයේ ලංසු අංකය හා භෝජනාගාරයේ නම සඳහන් කර "දුම්රිය ස්ථාන භෝජනාගාර සඳහා ටෙන්ඩර් පත" යනුවෙන් සඳහන් කොට, එම කවරය මුද්‍රා තබා 2022 සැප්තැම්බර් මස 23 වන දින ප.ව 02.00 පෙර ලැබෙන සේ සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෙළද හා අලෙවි කාර්යාලය, දුම්රිය මූලස්ථානය, ඔල්කට් මාවත, කොළඹ 10. ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථාන වෙළද හා අලෙවි කළමණාකරුගේ නිල කාමරයෙහි ටෙන්ඩර්පත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හෝ කටයුතු කළ යුතුය.එම වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී ප්‍රමාදවූ හා නැතිවූ අයදුම්පත් පිළිබඳව සලකා බලනු නොලැබේ.

**04. ලංසු භාරගැනීම හා විවෘත කිරීම**

2022 සැප්තැම්බර් මස 23 වන දින ප.ව.2.00 ට ඉහත 03 ඡේදයේ දක්වා ඇති පරිදි වෙළද හා අලෙවි කාර්යාලයේදී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ සහභාගී වීමට ඉඩදෙනු ලැබේ.

**05.** ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සියලු සේවකයන්ට හා ඔවුන්ගේ පවුල්වල ආසන්නම සාමාජිකයන්ට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා හිමිකමක් නැත.

**06.** ලංසු අයදුම් කිරීමට ප්‍රථම ඉහත සඳහන් සියළු භෝජනාගාර පරික්ෂාකිරීම සඳහා අයදුම්කරුවන් හට අවස්ථාව ලබා දෙන අතර ඒ සඳහා දුම්රිය මූලස්ථාන වෙළද හා අලෙවි කාර්යාලය මගින් අවසර ලබාගතයුතු වේ.

**07.** දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

**08.** ලංසුකරුවන්ට වැඩි විස්තර අවශ්‍ය නම්දුරකථන අංක :-011-2421281 – (දිගු අංකය -8235) ෆැක්ස් :- 011-2431909 හරහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ වෙළද හා අලෙවි කාර්යාලය වෙතින් ලබාගත හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
වෙළද හා අලෙවි කාර්යාලය,
දුම්රිය මූලස්ථානය,ඔල්කට් මාවත,කොළඹ 10.